
# රණවිරුවා

2020 ජූනි • 218 කලාපය

## මව්බිමට කැපවූවන්ට පින් සෙවණක ආශිර්වාද...

කොවිඩ් 19 වෛරසය මෙරට පැතිරයාම වැළැක්වීම සඳහා අනුපමේය කාර්යභාරයක් ඉටුකළ ත්‍රිවිධ හමුදා, පොලිස්, සෞඛ්‍ය හා වෙනත් අංශවල සේවයේ නිරත සියලුදෙනා වෙනුවෙන් අනුරාධපුර රුවන්වැලි මහා සෑ රදුන් අභියස පසුගියදා පැවති "දෙරණාභිවන්දනා" කෘතවේදීත්වයේ පිංකම...



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.



# කෘතවේදීත්වයේ මහා පිංකම රුවන්වැලි සෑ මළුවේදී....

කොවිඩ් - 19 වෛරසය පැතිරීයාම වැළැක්වීම සඳහා අනභිභවනීය කාර්ය භාරයක් ඉටුකළ සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු, ත්‍රිවිධ හමුදා, පොලිස් හා විශේෂ කාර්ය බළකා සාමාජිකයින් ඇතුළු සියලු දෙනාට ආශිර්වාද එක් කරමින් "දෙරණ" රූපවාහිණී නාලිකාව මඟින් සංවිධානය කරන ලද "දෙරණාභිවන්දනා" කෘතවේදීත්වයේ පිංකම පසුගිය ජූනි 05 වන දින සන්ධ්‍යාවේ ඓතිහාසික රුවන්වැලි මහා සෑ රඳුන් අභිමුවදී පැවැත්විණ. ශාන්ති පදනමේ අනුශාසක අතිපූජ්‍ය ආචාර්ය කොටපොල අමරකීර්ති නායක හිමිපාණන්ගේ අනුශාසකත්වයෙන් පැවැත්වූ මෙම ආශිර්වාද පිංකමට සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය සේවා ඇමතිනී පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති හා කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානි ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන්, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිණී සුජීවා නෙල්සන් මැතිණිය ඇතුළු පිරිසක් සහභාගී වූහ.







# අභිමන් පරිශ්‍රයේ සොඳුරු චමත්කාරය විඳින්න එන්න....





නව යුද්ධ හමුදා මූලස්ථානය ස්ථානගත කිරීමෙන් අනතුරුව, ඒ අවට පරිසරය අලංකාරවත් කිරීම සඳහා දියත් කරනු ලැබූ "තුරු මිතුරු නව රටක්" ව්‍යාපෘතියේ 4 වන අදියර ඉකුත් ජූනි 22 වන දින විවෘත විය. ඒ යටතේ ඉදිකළ නව ළමා උද්‍යානය විවෘත කිරීම, ශාරීරික යෝග්‍යතා මංතීරුවට යාබදව ස්ථානගත කළ T-55 යුධ ටැංකි දෙක නිරාවරණය කිරීම, එහි දෙපස පිහිටි සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන වීදි ලාම්පු ආලෝකමත් කිරීම හා යුද්ධ හමුදා මූලස්ථානයට හැරෙන මංසන්ධියේ ස්ථාපිත විදුලි පහන් කණුව ආලෝකමත් කිරීම ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් සිදු කෙරිණ. යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ සොඳුරු චමත්කාරය අත්විඳින්නට සිවිල් ජනතාවටද ඉඩකඩ වෙන්කොට තිබීම විශේෂත්වයකි.







# ජන්ම දින සමරා අනුරපුර පුදබිමෙහි පිංකම්...

2020 ජූනි 20 වන දිනට යෙදී තිබූ සන්නද්ධ හමුදා සේනාධිනායක අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ජන්ම දිනය නිමිත්තෙන් අනුරාධපුර රුවන්වැලි මහ සෑ රදුන් අභිමුවදී ආගමික වතාවත් සහ ආශීර්වාද පිංකම් රැසක් පැවැත්විණ. එම අවස්ථාවට අනෝමා රාජපක්ෂ මැතිණිය, ගරු අග්‍රාමාත්‍යතුමන් ඇතුළු ඥාති හිතමිත්‍රාදීන් රැසක්ද ආරක්ෂක ලේකම්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති, නාවික හා ගුවන් හමුදාධිපතිවරුද එක්වූහ.





# ඓතිහාසික සෙවනකට අභිමානවත් සම්ප්‍රාප්තිය...






වසර 139 ක අභිමානවත් ඉතිහාසයකට උරුමකම් ඇති ඓතිහාසික සීතාවක පුරවරයේ ස්ථාපිත යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානයට පසුගියදා ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සම්ප්‍රාප්තිය සිදුවිය. ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් සිදුවූ එම සංචාරයේදී එම මූලස්ථාන පරිශ්‍රයේ අභිනව ඉදිකිරීම් රැසක් විවෘත කිරීමද, යෝජිත ඉදිරිකිරීම් රැසක් සඳහා මුල්ගල තැබීමද යුද්ධ හමුදාධිපතිතුමාගේ සුරතින් සිදුවිය.

මෙම අවස්ථාවට ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් කේපී නුගේගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු එම මූලස්ථාන නිලධාරීන්, සෙසුනිලයින් විශාල පිරිසක් ද එක්වූහ.





# යුද්ධ හමුදා "පොසොන් කලාපය"



උදාවූ පොසොන් පුර පසළොස්වක පොහෝ දිනය නිමිත්තෙන් බත්තරමුල්ල මධ්‍යම පරිසර අධිකාරිය අසල සිට යුද්ධ හමුදා මූලස්ථානය දක්වා පිවිසෙන මාර්ගයේ වර්ණවත් පහන් කූඩු ප්‍රදර්ශනයක් පැවැත්විණ. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර එන්ඩීයූ ගේ ආරාධනයෙන් සපැමිණි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් අලෝකමත් වූ එම පහන් කූඩු ප්‍රදර්ශනයට යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 24 ක් නියෝජනය කරමින් නිර්මාණ ඉදිරිපත් කර තිබිණ.








# නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රථම සංචාරය...

බුත්තල නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානයේ 2020 වර්ෂය සඳහා ඒකක අණදෙන නිලධාරී පාඨමාලා අංක 07 සහ නිලධාරී අණදෙන පාඨමාලා අංක 19 හි ආරම්භය ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පසුගිය ජුනි 15 වන දින සිදුකෙරිණ.

නිලධාරී ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රයේ දීර්ඝ කාලීන අවශ්‍යතාවක්ව පැවති ශිෂ්‍ය නිලධාරීන් සඳහා නවතමයෙන් ඉදිකරන ලද දෙමහල් නවාතැන් ගොඩනැගිල්ල විවෘත කිරීම, නිලධාරී නිවස්නයේ නව ගොඩනැගිල්ලේ ඉදිකරන ලද "එළිමහන් නිදහස් කලාපය" විවෘත කිරීමද ප්‍රධාන ආරාධිත අමුත්තා අතින් සිදුවිය. මෙම අවස්ථාවට එම පුහුණු පාසලේ සේනාවිධායක මේජර් ජෙනරාල් කේජේ ජයවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් ඇතුළු පිරිසක් එක්වූහ.








## එතෙර විහිදන රණවිරු විස්කම්...



ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා භට පිරිස් විසින් නිෂ්පාදනය කරන ලද යුනිකෝන්/යුනිබෆල් රථ 9 ක්, ආපදා රථයක් සහ මෙරටට ආනයනය කරන ලද වාහන අමතර කොටස් බහාලුම් 03 ක් බටහිර අප්‍රිකාවේ, මාලි රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරී සඳහා යොදවා සිටින ශ්‍රී ලාංකික සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායමේ (Combat Convoy Company) පරිහරණය සඳහා යැවීමට නියමිතව ඇත.

නැව්ගත කිරීමට සූදානම් කොට ඇති අදාළ යන්ත්‍රෝපකරණ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් පසුගිය ජුනි 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී බෙන් ලයින් ෂිපිං ඒජන්සි (පුද්ගලික) සමාගමේ (Ben Line Shipping Agencies (Pvt Ltd) කළමනාකරු රාහිලීන් බූරම් මහතා වෙත සංකේතාත්මකව භාරදෙන ලදී.

## යුද්ධ හමුදා මූලස්ථානයට නව ඉන්දන පිරවුම්හලක්...




යුද්ධ හමුදා මූලස්ථානයට යාබදව අලංකාරවත් ලෙස ඉදිකළ ඉන්දන පිරවුම්හලක් ඉකුත් ජූනි 25 වන දින උදෑසන පැවති චාම් උත්සවයකදී විවෘත කෙරිණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එක්විය. එහිදී නව පිරවුම්හලේ ඇරඹුම සංකේතවත් කරමින් යුද්ධ හමුදාධිපතිතුමන් ප්‍රථමයෙන්ම සිය නිල රථයට ඉන්ධන පුරවා ගැනීමට කටයුතු කරන ලදී. යුද්ධ හමුදා මූලස්ථාන ඉදිකිරීම් ප්‍රධාන ව්‍යාපෘතියේ අත්‍යවශ්‍ය අංගයක් වූ මෙම නව පිරවුම්හල ලුතිනන් කර්නල් නාරද වනසිංහ ගේ උපදෙස් මත 8 වන ඉංජිනේරු සේවා බළකායේ භට පිරිස් විසින් ඉදිකරනු ලැබූහ. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අධීක්ෂණය යටතේ මේ සඳහා රුපියල් මිලියන 36 ක් වැය කෙරිණ.



# උතුරු බිමෙහි නිරීක්ෂණයක්...





ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති හා කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී, ගුවන් හා නාවික හමුදාපතිවරු, පොලිස්පති ඇතුළු ඉහළපෙලේ ආරක්ෂක අංශ ප්‍රධානීන් පිරිසක් පසුගිය ජූනි 17 වන දින යාපනය ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශයේ සංචාරයක නිරත වූහ. යාපනයේ ආරක්ෂක තත්වය මෙන්ම කොවිඩ් 19 වෛරසය පාලනය පිළිබඳ සොයා බැලීම ඔවුන්ගේ එම සංචාරයේ අරමුණ විය.

## "Club Hotel Dolphin" ජාතික මෙහෙවර ඇගයේ...



යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබන නිරෝධායන ක්‍රියාවලිය සඳහා ඩොල්ෆින් හෝටලය (Club Hotel Dolphin) කිසිදු අයකිරීමකින් තොරව ලබාදෙමින් එහි කාර්ය මණ්ඩලය සිදුකරනු ලැබූ ප්‍රශංසනීය මෙහෙවර පසුගියදා යුද්ධ හමුදාවේ ඇගයුමට ලක්විය. කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම හෝටලයේ නියෝජිතයින් සහ සම්බන්ධීකරණ නිලධාරීන් පසුගියදා යුද්ධ හමුදාධිපති කාර්යාලය වෙත කැඳවා ඔවුනට සිය හෘදයාංගම කෘතඥතාවය පුද කළේය.

## විරු මෙහෙවර අගයා පරිත්‍යාගයක්...




කොවිඩ් - 19 තර්ජනය හමුවේ අසමසම කැපවීමක් සිදුකරන යුද්ධ හමුදා සාමාජිකයින්ගේ සේවය අගයා හයිඩ්‍රාමණී සමාගම් සමූහය විසින් සංග්‍රාමික නිල ඇඳුමට සමාන වර්ගයේ මුහුණු ආවරණ 20,000 ක් පසුගිය ජූනි 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී වෙත පරිත්‍යාග කරන ලදී. ක්‍රියාත්මක අධ්‍යක්‍ෂ ජෙනරාල් මේජර් ජෙනරාල් එච්පී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සම්බන්ධීකරණයෙන් යුත් එම පරිත්‍යාග භාරදෙනු ලැබූ අවස්ථාවට හයිඩ්‍රාමණී සමූහ ව්‍යාපාරයේ නිලධාරීන් පිරිසක්ද එක්වූහ.

## උණුසුම් සුබ පැතුම්...





මේජර් ජෙනරාල් නිලයට උසස් කරනු ලැබූ බ්‍රිගේඩියර් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජ්එස්එස් වනසිංහ ආර්එස්පී යූඑස්පී වෙත නිල ලාංඡන පැළඳවීම ශ්‍රී ජයවර්ධනපුර පිහිටි යුද්ධ හමුදා මූලස්ථානයේදී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ සුරතින් පසුගියදා සිදුකෙරුණේ උණුසුම් සුබ පැතුම් මධ්‍යයේය. සිය වෘත්තීය දිවියේ අභිමානවත් කඩඉමක් පසුකළ එම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට "රණවිරුවා" ද මෙසේ සුභාශිංසන එක් කරයි.

## සුභද හමුවක මතක සටහන්...



යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන ලෙස රාජකාරී භාරගත් මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී 2020 ජූනි 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේ දී ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී හමුවිය. එහිදී යුද්ධ හමුදාධිපතිතුමන් ඔහු වෙත සිය සුබපැතුම් එක්කළේය.



# ජය සතුට සුව සැපත සපිරි සුබ උපන් දිනක් වේවා...!!!

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ජන්ම දිනය සැමරීම වස් යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන් පසුගියදා එක්රොක් වූහ. යුද්ධ හමුදාධිපතිතුමන් පුදුම කරවූ එම අනපේක්ෂිත හමුවීමේ විචිත්‍ර මතක සටහනකි මේ.

# වට්ටප්පලෙයි කෝවිලේ වාර්ෂික පූජාව මෙවරත්...

මුලතිව් ආරක්ෂක සේනා මූලස්ථාන බලප්‍රදේශයෙහි ඇති වට්ටප්පලෙයි කන්නගි අම්මාන් කෝවිලෙහි වාර්ෂික පූජාව පසුගිය ජුනි 01 වන දින සිට 09 වන දින දක්වා පවත්වන ලදී. එහි අවසන් දින පූජාව සඳහා මුලතිව් ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ ගේ ආරාධනයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගී විය.

එහිදී යුද්ධ හමුදාධිපති ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් එම බලප්‍රදේශයේ වෙසෙන අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියලි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක්ද දියත් කරන ලදී. මෙම අවස්ථාව සඳහා ආසේමු(මු) බලප්‍රදේශයේ රාජකාරීයේ නියුතු සේනාංකාධිපතිවරු, ඉනපෙ(මු) ආඥාපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගි වූහ.





ලේවා වනිතා ලේවය
හුදෙක් රණවිරු දිරිය හා
සුබසාධනය පිණිස වුවද,
ඉන් ඔබ්බට විහිදුණු
බොහෝ ක්ෂේත්‍රයන් කරා
ඔවුන් සිය දායකත්වය
සපයා ඇත.
විටෙක බිරිඳක් ලෙසින්ද,
විටෙක සහෝදරියක්,
මවක් ලෙසින්ද වූ
ඕම බෙහෙවර
වර්තමාන යුද හමුදාවට
සුවිශාල ශක්තියක්
ඕක්තැන් කොට ඇත්තේය...



# සේවා වනිතා සේවා

## පෙර පාසල් ව්‍යාපෘතිය

මේ යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දරුවන් වෙනුවෙන් පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන (විරු කැකුළු පෙර පාසල පනාගොඩ, පල්ලේකැලේ, අනුරාධපුරය, ගාල්ල, දියතලාව, මැනිංටවුන්, ඉපලෝගම හා මින්නේරිය) සහනදායී මිල ගණන් යටතේ පවත්වාගෙන යනු ලබයි.

## නිවාස ආධාර සහ වෛද්‍ය ආධාර

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය/අතුරුදහන් හා ආබාධිත තත්වයට පත්ව සිටින රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් හට මෙන්ම සේවා කාලය වසර 05 ක් ඉක්මවා ඇති දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන් සහ සේවය ස්ථිර සිවිල් සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් නව නිවාස, අර්ධ නිවාස, නාන කාමර උපාංග, ඉඩම් මිලදී ගැනීමට, ලෙඩ රෝග හා ශල්‍ය කර්ම සිදුකිරීම සඳහා මුල්‍යාධාර ලබාදීම සිදුකරනු ලබයි.

## ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

මෙමගින් යුද්ධයේදී මියගිය/අතුරුදහන්/ආබාධිත හා දැනට සේවයේ යෙදී සිටින රණවිරුවන්ගේ හා සිවිල් සේවකයින්ගේ දුවා දරුවන් හට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කර ගැනීමේ අරමුණින් මාසිකව හා වාර්ෂිකව ශිෂ්‍යත්ව ප්‍රධානය සිදු කරනු ලබයි. ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමේදි රෙජිමේන්තු මට්ටමින් හා කඩඉම් ලකුණු අනුව තෝරාගැනීම් සිදු කරනු ලබයි.

| අ/අ | ශිෂ්‍යත්වය | විස්තරය | මුදල |
|---|---|---|---|
| 01 | මාසික ශිෂ්‍යත්වය | එක් දරුවෙකු සඳහා මාසිකව ලැබෙන ශිෂ්‍යාධාරය (රෙජිමේන්තු මට්ටමින්) | රු : 1500.00 |
| 02 | වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රදානය (කඩඉම් ලකුණුවලට අනුව) | 1 වසර සිට 5 වසර දක්වා | රු : 15000.00 |
| | | 6 වසර සිට 11 වසර දක්වා | රු : 20000.00 |
| | | 12 වසර සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා | රු : 25000.00 |

## ආහාර ව්‍යාපෘති

### ✷ සුභ සාධක ආහාර ව්‍යාපෘතිය - මැනිංටවුන්/ අකුරේගොඩ

මෙම ව්‍යාපෘතිය මගින් යුහමු යටතේ රාජකාරියේ නියුතු සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ උදා/දිවා/රාත්‍රී ආහාර පිරිසිදුව ප්‍රනීතව සකස්කර සහනදායි මිළට අලෙවි කරනු ලබයි.

දුරකථන අංකය : අකුරේගොඩ - 011-3020869, මැනිංටවුන් - 011-3090180

### ✷ මැනිංටවුන් බේකරි ව්‍යාපෘතිය

මෙමගින් යුද්ධ හමුදා නිලධාරී, සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම යුද්ධ හමුදා නොවන අයවලුන් හට කේක්, බේකරි නිෂ්පාදන, රයිස්, කොත්තු, කෙටි ආහාර වර්ග සහනදායි මිළ ගණන් යටතේ ලබාගැනීමට හැකිවේ.

දුරකථන අංකය : 011-3288272

### ✷ යුහමු අවන්හල

මෙමගින් යුහමු යටතේ රාජකාරියේ නියුතු සෙසුනිලයින්ගේ හා සිවිල් සේවක මහත්ම මහත්මීන් හට බේකරි නිෂ්පාදන හා කෙටි ආහාර මෙන්ම බීම වර්ග, බිස්කට්, සහනදායි මිළ ගණන් යටතේ ලබා ගැනීමට හැකිවේ.

දුරකථන අංකය : 011-4051830

### ✷ යුහ සුභසාධක වෙළඳසැල් ව්‍යාපෘතිය

මෙමගින් යුද්ධ හමුදා නිලධාරී, සෙසුනිලයින් හා සිවිල් සේවක මහත්ම මහත්මීන් මෙන්ම යුද්ධ හමුදා නොවන අයවළුන් හට වියළි සලාක මෙන්ම දෛනිකව භාවිතයට අවශ්‍ය නිෂ්පාදන මිළදී ගැනීමට හැකිවේ. තවද පහත සදහන් ස්ථානයන් හි මෙම වෙළඳසැල් ව්‍යාප්තව ඇත.

මැනිංටවුන් : 011-2681695, කැන්දලන්ද : 011-2855722, ජාවත්ත : 011-2593331, වත්තල : 011-2982633

### ✷ රූපලාවන්‍යාගාරය - පනාගොඩ

ආසේමු (බටහිර) යුද්ධ හමුදා ජනපදය තුළ ස්ථාපිත මෙම රූපලාවන්‍යාගාරය යුද්ධ හමුදා නිලධාරිණියන්, කාන්තා සෙබළියන් හා සිවිල් සේවක මහත්මීන් මෙන්ම යුද්ධ හමුදා නොවන කාන්තාවන් හටද සියලුම රූපලාවන්‍ය කටයුතු හා මනාලියන් හැඩගැන්වීමේ කටයුතු සහනදායි මිළ ගණන් යටතේ දිවයිනේ පිළිගත් රූපලාවන්‍ය ආයතනයන් වෙතින් පාඨමාලා හදාරන ලද යුද්ධ හමුදා සෙබළියන් විසින් සිදුකරනු ලබයි.

දුරකථන අංකය : 011-2748844/ 011-3061884

## මැහුම්හල

මෙම ව්‍යාපෘතිය මගින් යුද්ධ හමුදා රාජකාරියේ නියුතු නිලධාරී/සෙසුනිළයින්ගේ සියලුම වර්ගයේ නිල ඇඳුම් සහනදායි මිළ ගණන් යටතේ මසා නිමකර දෙනු ලබයි.

## කඩදාසි ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘතිය

මෙමගින් යුද්ධ හමුදාවේ සියලුම ඉවතලන කඩදාසි මෙන්ම ස්වාභාවික අමුද්‍රව්‍ය වන කෙසෙල්, පිදුරු, තණකොළ, රම්පේ, ජපන්ජබර, මානා හා විවිධ මල් වර්ග යොදා විවිධ වර්ගයේ කඩදාසි, බෑග් වර්ග නිපදවනු ලබයි.

දුරකථන අංකය : 011-2514609

*ඉදිරිපත් කිරීම : සේවා වනිතා ඒකකය, යුද්ධ හමුදා මූලස්ථානය.*


**රණවිරුවා Online කියවන්න....**




පිවිසෙන්න **www.army.lk**

සිංහල නම් - තතු විමසුම → රණවිරු සඟරාව

English නම් - About Us → 'Ranaviruwa' Magazine

# ස්වාභාවික පළතුරු බීමක මිහිර විඳින්න...

යුහමු තුළ රාජකාරියේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින්ගේ දෛනික ආහාර පාන ලබාගැනීම සඳහා යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය මගින් ජන අවන්හලක් පවත්වාගෙන යනු ලබයි. සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනියගේ උපදෙස් පරිදි පසුගිය ජූනි 11 වන දින සිට එහි පළතුරු යුෂ බීම හලක් ආරම්භ කිරීමටද කටයුතු කරන ලදී.

ඒ අනුව ස්වභාවික පළතුරු යුෂ බීම යුද්ධ හමුදා සාමාජිකයින් හට සහනදායී මිළ ගණන් යටතේ එමගින් ලබාගැනීමේ අවස්ථාව සැලසේ. එම බීමහල විවෘත කිරීමේ අවස්ථාවට බ්‍රිගේඩියර් අයිපී කන්දනආරච්චි, කර්නල් (සම්බන්ධීකරණ) කර්නල් ටීඑස් බාලසූරිය, කර්නල් (පාලන) කර්නල් ඩබ්ලිව්එම්ජ්බී විජේකෝන් යූඑස්පී ඇතුළු යුද්ධ හමුදා නිලධාරීන් පිරිසක් සහභාගී වූහ.

# ගැමුණු හේවා බළකා සේවා වනිතා ශාඛාව...

ගැමුණු හේවා රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය හරිෂ්මන් බංසජායා මහත්මියගේ ප්‍රධානත්වයෙන් එහි සාමාජිකාවෝ ඉකුත් ජූනි 09 වන දින මොරටුව රාවතාවත්ත හි පිහිටි සර්වෝදය සුවසෙත මධ්‍යස්ථානයේ නේවාසිකව සිටින සිඟිති දූවා දරුවන් සඳහා අවශ්‍ය වියළි ආහාර ද්‍රව්‍ය සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ප්‍රධානය කිරීමේ වැඩසටහනකට එක්වූහ.





# සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...





ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති සහ සිංහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ සහ සිංහ රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ඉන්දු සෙනෙවිරත්න මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් ජූනි 13 වන දින "සතුටින් පිරි සොඳුරු පවුලක්" යන තේමාව යටතේ වැඩමුලුවක් පවත්වන ලදී. මේ සඳහා සිංහ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන්, මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි වූහ. ප්‍රවීණ දේශක ලසන්ත කාරියප්පෙරුම මහතා විසින් මෙම වැඩමුලුව මෙහෙයවන ලදී.

## යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාව...

යාන්ත්‍රික පාබල රෙජිමේන්තු කාන්තා සමාජයේ 13 වන වාර්ෂික මහා සභා රැස්වීම සහ නව සභාපතිනිය පිළිගැනීමේ උත්සවය 2020 මාර්තු 07 වන දින එම රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එම අවස්ථාවට ගරු සභාපතිනිය මනෝරි ජයසුන්දර මහත්මිය ඇතුළු කාන්තා සමාජ සාමාජිකාවන් 42 ක් සහභාගී වූහ.






## සේවා බළකා සේවා වනිතා ශාඛාව...

සේවා බළකා සේවා වනිතා ශාඛාවේ 10 වන ගරු සභාපතිනිය ලෙස තරංගා ප්‍රියදර්ශනී කන්දනආරච්චි මහත්මිය එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ඉකුත් ජූනි 15 වන දින සුබ මොහොතින් වැඩ භාරගන්නා ලදී.





## යුධෝපකරණ බළකා සේවා වනිතා ශාඛාව...





පසුගිය මැයි 07 වන දිනට යෙදුණු වෙසක් පොහොය නිමිත්තෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකා සේවා වනිතා ශාඛාව මගින් රුවන්වැලි මහසෑය අභියසදී කප්රුක් පූජාවක් සහ කිරි ආහාර පූජාවක් පවත්වන ලදී. සේවා වනිතා ගරු සභාපතිනිය ගේ ප්‍රධානත්වයෙන් පැවති එම පින්බර කටයුත්තට රෙජිමේන්තු සේවා වනිතා සාමාජිකාවෝ රැසක්ද එක්වූහ.





# අභිනව නිවසට මුල්ගල...

යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ඉල්ලීමකට අනුව කුමාර වීරසූරිය යන අයගේ ධන පරිත්‍යාගයෙන් යුතුව ජේ/361 කරනවායි (උතුර) ග්‍රාමසේවා වසමේ පදිංචි අඩු ආදායම්ලාභිනියකු වෙනුවෙන් ඉදිකෙරෙන නිවසක් සඳහා මුල්ගල තැබීම ආඥාපති ගේ ප්‍රධානත්වයෙන් 2020 ජුනි 12 වන දින සිදුකරන ලදී.

55 වන සේනාංකයේ සම්බන්ධීකරණයෙන් 551 වන බලසේනාවේ අධීක්ෂණය යටතේ ඉදිවන එම නිවස සඳහා 4 වන බලඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ශ්‍රමදායකත්වය සැපයේ.





# පින් බිමට රන් වැටක්...

නාගදීප පුරාණ රජමහා විහාරයේ බෝධිය වටා රන් වැටක් සාදා පූජා කිරීම යාපනය ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීආර් වනිගසූරිය වීඑස්වී යූඑස්පී එන්ඩීයූ යූඑස්ඒසීජීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් 2020 ජුනි 05 වන දින සිදුකෙරිණ. නාගදීප පුරාණ රජමහා විහාරාධිපති පූජ්‍ය නවදගල පදුමකීර්ති තිස්ස ස්වාමීන් වහන්සේ ගේ අනුශාසකත්වයෙන් 511 වන බලසේනාධිපති ගේ සම්බන්ධීකරණයෙන් සිදුකළ එම මාහැඟි පුණ්‍ය කටයුත්තට හැටන් නැෂනල් බැංකුවේ නීති අධ්‍යක්ෂිකා තුෂාරි රණවීර මහත්මිය ඇතුළු පිරිසකගේ මූල්‍ය දායකත්වය හිමිවූහ.

# සඳහිරු සෑයේ හතරැස් කොටුවට මුල්ගල තැබේ...





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) බලප්‍රදේශයට අයත් අනුරාධපුර පූජා භූමියේ රණවිරුවන් සිහිකිරීම වස් ඉදිකෙරෙන සඳහිරු සෑය චෛත්‍යයේ හතරැස් කොටුව සඳහා මුල්ගල තැබීම මහානායක ස්වාමීන් වහන්සේලාගේ සහ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් පසුගියදා සිදුකරන ලදී. එම පුණ්‍යවන්ත කටයුත්ත ආරක්ෂක ලේකම් නියෝජනය කරමින් වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ විසින් සිදුකරන ලදී. මෙම අවස්ථාවට 21 වන සේනාංකාධිපති, 212 වන බලසේනාධිපති, 9 ඉසේරෙ, 5 ශ්‍රීලංජාආබමු ඒකක අණදෙන නිලධාරීන් හා සෙසුනිලයින්  රැසක් සහභාගී වූහ. සඳහිරු සෑය චෛත්‍යයේ සියලු ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන්නේද ත්‍රිවිධ හමුදා හා සිවිල් ආරක්ෂක බළකා සාමාජිකයින්ගේ ශ්‍රමදායකත්වයෙනි.

# නව ආඥාපතිගේ සංචාරය...





ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් ජේඑම්යූඩී ජයසිංහ සිය තනතුරේ වැඩ භාරගැනීමෙන් අනතුරුව පසුගියදා එම බලප්‍රදේශයේ ස්ථාපිත සේනාංකයන්හි කඳවුරු සංචාරයක නිරත විය. ආඥාපති විසින් 54 වන සේනාංකයේ කඳවුරු සංචාරයෙන් අනතුරුව මන්නාරම අගරදගුරු එමානුවෙල් ප්‍රනාන්දු පියතුමන් ද මුණගැසිණ. 542 වන බසේමු විසින් සංවිධානය කරන ලද සිලාවතුර විල්පත්තු රක්ෂිතයේ රුක්රෝපණය කිරීමේ අවස්ථාවක් සඳහා ද සහභාගි වූ ආඥාපතිවරයා එම ප්‍රදේශයේ ජනතාවට සහ පාසල් ළමුන් සඳහා පාසල් උපකරණ සහ වියළි ආහාර ද්‍රව්‍ය බෙදාදීමටද සහභාගී විය.

# සංචාරයක සටහන්...





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති ලෙස පසුගියදා වැඩ භාරගත් මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ජ්එස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූනි 4, 6, 7 යන දිනයන්හි එම මූලස්ථානය යටතේ පාලනය වන 23 වන සේනාංකය හා 231, 232, 233 යන බළසේනාවන්හි සංචාරයක නිරත විය. ප්‍රදේශයේ ආරක්ෂක තත්වය, භට පිරිස්වල දෛනික ක්‍රියාකාරකම් සේම ඔවුන්ගේ සුබසාධන කටයුතු පිළිබඳව සිය අවධානය යොමුකළ ආඥාපතිවරයා එහි භට පිරිස් ඇමතීමටද කටයුතු කළේය.

# කොරෝනා මැඩලීමට මුල්වෙමින්...





23 වන සේනාංකයේ සේනාංකාධිපති සහ නැගෙනහිර ආරක්ෂක සේනා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරී ගේ ඉල්ලීමකට අනුව විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයින් පිරිසක් ඉකුත් ජූනි 23 වන දින දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභී පවුල් 50 ක් සඳහා වියළි ආහාර සහ මුලුතැන්ගෙයි උපකරණ බෙදාදීමේ වැඩසටහනක් දියත්කරන ලදී.

ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ජ්එස් බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ කදිරපුර, බඹරවාන, සූරිය පොකුණ, හේනානිගල සහ මාවනවේල යන ගම්මානවල ජීවත්වන තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් මෙම ප්‍රතිලාභ ලැබීමට හිමිකම් කියූහ. 233 වන බළසේනාවේ භටපිරිස් විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.




# කඳවුරු පිරික්සුමක නියැළෙමින්...

බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක ගේ ප්‍රධානත්වයෙන් යුත් ජනාධිපති කාර්ය සාධක බළකායේ සාමාජිකයින් පිරිසක් ඉකුත් මැයි 12 වන දින කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයෙහි සංචාරය කරමින් ත්‍රිවිධ හමුදා කඳවුරුවල සෞඛ්‍ය ආරක්ෂණ ගැටලු පිළිබඳව සොයා බැලීය. මෙම අවස්ථාව සඳහා කිළිනොච්චි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් එච්එම්ජේකේ ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ද සහභාගී විය.

## ආතතිය දුරුකොට නිරෝගී දිවියක්...

කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානයේ අධීක්ෂණයෙන් යුතුව වර්තමාන රාජකාරී ස්වභාවය මත යුද්ධ හමුදාවේ සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ මානසික ආතතිය දුරුකර ඒ තුළින් මනා සෞඛ්‍යය සම්පන්න මනසකින් සොල්දාදුවෙකුගේ සේවය ලබාගැනීම අරමුණු කරගෙන මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් සංවිධානය කෙරුණු වැඩසටහනක් ඉකුත් ජූනි 24 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (කිළිනොච්චිය) ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.



නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මෙන්ම යුද්ධ හමුදා රෝහල - නාරාහේන්පිට රාජකාරී කරනු ලබන බ්‍රිගේඩියර් ආර්එම්එම් මොණරාගල ආර්එස්පී යූඑස්පී, මේජර් යූපී මල්ලවආරච්චි ඇතුළු උපදේශකයින් විසින් මෙම වැඩමුළුව පවත්වන ලදී. මේ සඳහා කිළිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථාන බළ ප්‍රදේශයේ රාජකාරී කරනු ලබන නිලධාරීන්, නිලධාරිණියන් 28 දෙනෙකු සහභාගි වූහ.







# සංවත්සර දිනය අභිමානවත්ව සමරයි...

2009 මැයි 05 වන දින නන්දිකඩාල් හිදී ස්ථාපනය කරන ලද ආරක්‍ෂක සේනා මූලස්ථානය මුලතිව් හි අභිමානවත් 11 වන සංවත්සරය එහි ආඥාපති මේජර් ජෙනරාල් පීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා පැවැත්විණි. වර්තමානයේ පවතින කොවිඩ් වසංගත තත්වය හමුවේ නිලධාරීන්, සෙසුනිලයින් සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති අභිමානවත් සැමරුම් උත්සවයේදී ආගමික වතාවත්වලට මුල්තැනක් හිමිවිය.






# පොසොන් උත්සවය සමරමින්...

උදාවූ පොසොන් පොහොය නිමිත්තෙන් 6 ශ්‍රීලවියාඉ සහ 16 ඉසේරෙ නිලධාරී සහ සෙසුනිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් මුලතිව් ඔඩ්ඩුසුඩාන් මාර්ගයේ වට්ටප්පලෙයි මංසන්ධිය අසල නිර්මාණය කරන ලද මහින්දාගමනය තේමාව කරගත් දර්ශණීය පහන් කූඩුව එදින සවස් යාමයේ මුලතිව් ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් පීඩබ්ලිව්ඩීකේ ජයතිලක යූඑස්පී එන්ඩීයූ ගේ සුරතින් විවෘත කෙරිණ.

# තුරු මිතුරු නව රටක්...



යුද්ධ හමුදාධිපතිගේ සංකල්පයකට අනුව "තුරු මිතුරු නව රටක්" හරිත සංකල්පයට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ උපදෙස් මත එම මූලස්ථානය යටතේ පාලනය වන බල ප්‍රදේශයන්හි ස්ථාපිත යුද්ධ හමුදා කඳවුරු තුළ රෝපණය කිරීම සඳහා විවිධ වර්ගයේ පැළ බෙදාදීමේ උත්සවයක් ඉකුත් ජූනි 11 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) හිදී පැවැත්විණ.



එහිදී පොල්, කරඳ, මී, සියඹලා, කොහොඹ, මාදං, කුඹුක්, තෙළඹු සහ කාය ඇතුළු විවිධ ඖෂධීය පැළ වර්ග තුන්දහසකට අධික ප්‍රමාණයක් ලබාදීම සිදුකරනු ලැබූ අතර, ආඥාපති විසින් එම පැළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා මූලස්ථානය, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකා රෙජිමේන්තු මධ්‍යස්ථානය, ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර), 14 වන සේනාංකය, 61 වන සේනාංකය සහ ශ්‍රී ලංකා රයිෆල් බළකාය වෙත ලබාදෙන ලදී.

# සංචාරයක මතක...



වයඹ පළාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සහ වත්මන් ආරක්ෂක තත්වය පිළිබඳ පූර්ව අවබෝධයක් ලබාගැනීමේ අරමුණින් ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් එච්ජේ සෙනෙවිරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඉකුත් ජූනි 22 දින 143 වන බලසේනා බලප්‍රදේශයට අයත් 16 වන ගජබා රෙජිමේන්තුවේ සහ 1 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවේ සංචාරයක නිරත විය. තවද ක්ලබ් ඩොල්ෆින් හෝටල් නිරෝධායන මධ්‍යස්ථානයේ සහ ඉරණවිල ප්‍රදේශයේ අභිනවයෙන් ඉදිකරන ලද කොවිඩ් 19 හුදෙකලා රෝහලද එහිදී ඔහුගේ නිරීක්ෂණයට බඳුන් විය.







# සුභද හමුවක මතක සටහන්...

මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී සිය තනතුරෙහි වැඩ භාර ගැනීමෙන් පසු ඉකුත් ජූනි 04 වන දින 23 වන ගජබා රෙජිමේන්තුව හා 3 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව යන ඒකකයන්හි නිරීක්ෂණ සංචාරයක නිරතවූ අතර, කතරගම කිරිවෙහෙර විහාරස්ථානය, කතරගම දේවාලය හා වැඩිහිටි කන්ද විහාරස්ථානයද වැඳපුදා ගන්නා ලදී.

මෙම අවස්ථාව සඳහා 12 වන සේනාංකයේ සේනාංකාධිපති, 122 වන බලසේනාධිපති ඇතුළු නිලධාරීන් රැසක් සහභාගි වූහ.





# අර්තාපල් වගා බිමක් අරඹමින්...

මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ මඟපෙන්වීම මත එහි භටපිරිස් විසින් දියතලාව කළුඅඹතැන්න ප්‍රදේශයේ අඳියර වශයෙන් සකස් කළ වගා බිමක අර්තාපල් බීජ රෝපණය කිරීමේ ව්‍යාපෘතියක් 2020 ජූනි 17 වන දින ඉතා සාර්ථකව ආරම්භ කරන ලදී.

# LEARN ENGLISH

***English Vision*** පාඩම් මාලාව ඔස්සේ ***Art of the language*** (භාෂාවේ කලාව) අධ්‍යනය සඳහා "රණවිරුවා" මාසික සඟරාව මගින් ඔබ හමුවට ගෙන එන තවත් එක් සරල ඉංග්‍රිසි වාක්‍ය රටාවක භාවිතය පිළිබඳව මෙම මස කලාපය තුළින් අවධානය යොමු කරමු.

## May as well

ආවේගශීලී ප්‍රකාශයක් කිරීමේදී "කරපුදෙන්" ආදී වශයෙන් අදහස් ප්‍රකාශ කිරීමේදී බහුලව භාවිතා වන වාක්‍යය රටාවකි.

***Fomular -*** සූත්‍රය

**Subject +May as well+ Verb + Object + Rest.**
සබ්ජෙක්ට් + මේ ඇස් වෙල් + වර්බ් + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කතෘ + කරපුදෙන් + ක්‍රියාපදය + කර්මය + ඉතිරිය.

***Ex /*** උදා :-

1. She may as well cry.
   ෂී මේ ඇස් වෙල් ක්‍රයි.
   ඇය ඔහේ අඩපුවාවේ/අඩපුදෙන්.

2. He may as well blame.
   හී මේ ඇස් වෙල් බ්ලේම්.
   ඔහු ඔහේ බැනපුවාවේ/බැනපුදෙන්.

3. Children may as well play in the evening.
   චිල්ඩ්‍රන් මේ ඇස් වෙල් ප්ලේ ඉන් ද ඊව්නින්ග්.
   ළමයි හවස සෙල්ලම් කරපුදෙන්.

***Nota Bene /*** සැ:යු :-

ඉහත වාක්‍යය පිළිබඳ සැලකීමේදී පහත වාක්‍යය රටා වලට අනුව වාක්‍යය සැකසිය හැකිය.

***Ex /*** උදා :-

¦ **Subject :-** කර්තෘ පදය ඒකවචන හා බහුවචන රූප උපකාරක ක්‍රියා පද සමඟ ව්‍යාකරණානුකූලව භාවිතා වේ.

¦ **May as well:-** "කරපුදෙන්" ආදී වශයෙන් අර්ථය ගැනීම සඳහා මෙම කණ්ඩය කිසිදු වෙනසකින් තොරව වාක්‍යයේ භාවිතා වේ.

¦ **Verb :-** ක්‍රියා පදය වාක්‍යයේ භාවිතා කිරීමේදි ක්‍රියා පදයක් ලෙස භාවිතා කළ යුතුය.

¦ **Object :-** කර්ම පදය වශයෙන් කර්තෘ කරන ක්‍රියාවට භාජනය වන බලපෑම් ලබන පුද්ගලයෙකු හෝ පදයක් වේ නම් එය කර්ම පදය ලෙස වාක්‍යයෙහි ඒකවචන, බහුවචන බේදයකින් තොරව භාවිතා වේ.

¦ **Rest :-** ඉතිරිය වාක්‍යයෙහි කර්තෘ, ක්‍රියාව, කර්මය ආදී වශයෙන් පිළිවෙලින් යෙදී කාලය හඟවන පද වේ නම් ඒවා ඉතිරිය ලෙස වාක්‍යයෙහි අග භාවිතා වේ.

Analysis of the sentence formation
වාක්‍යය රටාවෙහි සැකැස්ම විශ්ලේශනය.


Subject +May as well+ Verb + Object + Rest.
සබ්ජෙක්ට් + මේ ඇස් වෙල් + වර්බ් + ඔබ්ජෙක්ට් + රෙස්ට්.
කතෘ + කරපුදෙන් + ක්‍රියාපදය + කර්මය + ඉතිරිය.

She may as well cry.
ෂී මේ ඇස් වෙල් ක්‍රයි.
ඇය ඔහේ අඩපුවාවේ.

***" English vision"*** නව පාඩම් මාලාවක් ඔස්සේ ඔබගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය සඳහා "රණවිරුවා" මීළඟ කලාපය සමඟ එක්වන්න. තවද ඔබට මඟ හැරුණු පාඩම් අධ්‍යයනය කිරීම සඳහා පහත දී ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**කපිතාන් චමින්ද ලියනගේ**
**ශ්‍රීලයුපොදුසේබ**
**සංඥා පුහුණු පාසල - බුවැලිකඩ**
**www.englishvision.lk**





"මීටරේකට වැඩිය දුර යන්ඩත් බෑ. ඒ වුනාට ලෝකේ නොගිය තැනකුත් නෑ" මේ වර්තමානයේ මුළු ලොව ම බියට පත්කළ කොවිඩ් 19 හෙවත් කොරෝනා වෛරසය ගැන සමාජ මාධ්‍යයක පළ ව තිබූ අදහසකි. සොබාදහම මෙන්ම මිනිස් දහම ද අභිබවා කාලයටත් වැඩි වේගයෙන් භෞතික දියුණුව සහ සැප සම්පත් සොයා ගිය මිනිසුන්ට, තමන් ගතකළ ජීවිතයේ යථාර්ථය පිළිබඳ ව යළි යළිත් විවේකී ව ආවර්ජනය කරන්නට ලබා දුන් වටිනා අවස්ථාවක් ලෙස මෙය සැළකිය හැකිය. වත්මන් ලෝකය කෙතරම් ආර්ථික, දේශපාලනික සහ තාක්ෂණික දියුණුවක් ලබාගත්ත ද ඒ සියල්ල ඇසට නොපෙනෙන වෛරසයක් විසින් පරාජය කරනු ලැබ ඇත.

# තුන්බිය, රතන සූත්‍රය සහ කොරෝනා

වත්මනෙහි මෙන් ම පුරාණයේ ද රෝග පීඩාවන්ගෙන් සුවය ලැබීමට වෛද්‍ය ප්‍රතිකාරයන්ට අමතර ව පිරිත් දේශනාවන් සිදුකර ආශීර්වාද ප්‍රාර්ථනා කිරීමටත්, බෝධි පූජා වැනි ආගමික වත්පිළිවෙත්හි නියැළීමටත් ලාංකේය ජනතාව පුරුදු වී සිටිති. කොරෝනා වෛරසය පැතිරෙද්දී බුදුරදුන් ජීවමාන අවධියේ විශාලා මහනුවර තුන්බිය දුරු කිරීමට දේශනා කර වදළ රතන සූත්‍රය නිතර සජ්ඣායනා කිරීමට ගිහි පැවිදි කවුරුත් උනන්දු වූහ. මේ ලිපිය සැකසෙන්නේ එකී තුන්බිය ඇති වූ ආකාරයත්, රතන සූත්‍රයේ ඇති බලයත්, වසංගත රෝග පීඩාවන්ගෙන් මිදීමට රතන සූත්‍ර දේශනාවෙන් බුදුරදුන් පෙන්වා වදළ මාර්ගයත් පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ඔබට ලබාදීමටයි.

බුදුරජාණන් වහන්සේ ජීවමාන ව වැඩ සිටි කාලයේ දඹදිව සොළොස් මහා ජනපදයන් අතර වජ්ජි දේශය අතිශයින් සමෘද්ධිමත් දේශයකි. විශාලාව, වජ්ජි ජනපදයේ අගනුවරයි. වර්තමානයේ ඉන්දියාවේ උත්තර් ප්‍රදේශයේ බිහාර් ප්‍රාන්තයට අයත් වෛශාලි නමින් එය හැඳින්වෙයි. ආර්ථික, දේශපාලනික මෙන් ම භෞතික දියුණුවෙන් ද වජ්ජි රාජධානිය අතිශයින් ප්‍රබල රාජ්‍යයක් විය. විශාලා අගනගරයේ සමෘද්ධිය ගැන කෝට්ටේ යුගයේ වැඩවිසූ වීදගම මහාමෛත්‍රිය හිමිපාණන් වහන්සේ රචනා කළ බුදුගුණාලංකාරය නම් කාව්‍ය ග්‍රන්ථයේ මෙසේ වර්ණනා කර ඇත.

**සගසිරි අසාලා**  
**කළයුරු සොඳුරු සාලා**  
**සිරින් සුවිසාලා**  
**පවර නුවරෙක් වී විසාලා**

(දිව්‍ය ලෝකයේ අලංකාරය අසාගෙන, ඒ ආකාරයට තැනවූවාක් වැනි අලංකාර මන්දිර ඇති, සියලු සම්පත්තියෙන් පිරුණා වූ විශාලා නම් වූ උතුම් නගරයක් විය.)

**ගනරන් කොත් පැළඳි**  
**බිතු සිතුවමින් සිත් බැඳි**  
**මිණිපහ පැහැ විහිදි**  
**කොවේ මාවේ සියෙන් සිය සැදි**

(ගනරන් කොත් සහිත, සිත්ගන්නා බිත්ති චිත්‍රවලින් අලංකාර වූ, මැණික් වලින් නිමකළ මන්දිරවල දීප්තියෙන්

බබලන කුඩා වීදි සහ මහ වීදි සිය ගණනකින් යුක්ත විය.)

වජ්ජි හෙවත් ලිච්ඡවීහු විශාලාවේ පාලකයෝ වූහ. ඔවුන් ගණනින් හත්දහස් හත්සිය හතක් වූ බව පැවසේ. බුදුරජාණන් වහන්සේ වරෙක භික්ෂූන් වහන්සේලා අමතා දේශනා කළේ ලිච්ඡවීන්ගේ සප්ත අපරිහානීය ධර්මයන් සංඝ ශාසනයේ ඉදිරි පැවැත්මට ආදර්ශයක් කරගන්නා ලෙසයි. එසේ ම ඔවුහු අතිශයින් ධාර්මික, පැහැපත් හා ශක්තිමත් ශරීර ඇති ආදර්ශමත් පාලකයන් වූ බව බුදුගුණාලංකාරයේ මෙසේ සඳහන් වෙයි.

**දුසිරිත සිත නැවති**
**රද නීති දත් ගුණ ඇති**
**මැදහත් ලෙස පැවති**
**එරජ ලිච්ඡවි නිරිඳු නම් වෙති**

(දුශ්චරිතය සිතට ඇතුල් කර නොගනිමින්, රාජ නීතිය හොඳින් දැනගෙන, සියලු රටවැසියන්ට සමාන සැළකිලි ඇතිව වසන එම ගුණවත් රජවරු ලිච්ඡවීහු නම් වෙති.)

**නොබලා වරද තන්**
**නො නැමී බසට මහතන්**
**විලසින් සිය සුතන්**
**සතන් රකිනුය බලා ඇම තන්**

(ඒ රජවරු වැරදි කරන අය ආරක්ෂා නොකොට, උසස් යයි සැළකෙන්නන්ගේ වචනයට අගතිගාමී ලෙස අවනත නොවී, හැම දේ ගැන ම මැනවින් සොයා බලා තම දරුවන් රකින මෙන් රටවැසියන් ව ආරක්ෂා කරති.)

**රන් රූ සදිසියහ**
**දැක දැක නොයන රිසියහ**
**කන්කලු සුබැසියහ**
**ඔහුම නරදෙව් නමට රිසියහ**

(රන්වලින් තැනූ රූප මෙන් ශෝභාමත් වූ ඒ රජවරු කොතරම් දැක්කත් දැකීමේ ආශාව නිම නොවේ. එසේ ම ඔවුහු කනට ප්‍රිය හොඳ වචන කතා කරති. එබැවින් ඒ රජවරු මනුෂ්‍යයන්ගේ දෙවිවරුන් ලෙස හැඳින්වීම සුදුසුය.)

මෙසේ අතිශයින් සශ්‍රීක, දියුණු රාජ්‍යයක් ව පැවති විශාලාවෙහි බලාපොරොත්තු නොවූ ලෙස දීර්ඝ කාලීන නියඟයක් හටගත්තේය. නියඟය දරුණු වත්ම ගොවිතැන් විනාශ වූ අතර වැසි නොලැබීම නිසා පානීය, පරිභෝජනීය ජලය හිඟ විය. දුර්භික්ෂයෙන් පීඩා විඳි විශාලා නුවර වැසියන්ට වසංගත රෝගයක් වැළඳිණි. ඒ රෝගය නිසා දහස් ගණන් එකවර මරණයට පත්වූහ. දිව්‍යමය නගරයකට සමාන වූ විශාලාව අමු සොහොනක් බවට පත්විය. මරණයට පත්වන්නවුන්ගේ මෘතදේහයන් කුණු වී දුර්ගන්ධයෙන් විශාලා නගරය පිරෙද්දී අමනුෂ්‍ය බලවේගයන් ද පරිසරය ආක්‍රමණය කළහ. එම විපත බුදුගුණාලංකාරයේ මෙසේ විස්තර වෙයි.

**දඹදිව් තල අවට**
**උවදුරු තාක් එක්කොට**
**නොහැරගෙන එකවිට**
**අවුත් මරු බට වැන්න එපුරට**

(මරුවා මුළු දඹදිව පුරා තිබුණු තාක් උපද්‍රව එකක් නැර අරගෙන එක්වර ම ඒ නුවරට පිවිසියාක් වැනිය.)

**දෙර දෙර මිනී බෙර**
**ගෙයි ගෙයි හඬය බියකර**
**පිළ පිළ අඳින මර**
**දුගී ගිලනුන්ගෙන් නැත'වසර**

(සෑම ගෙයක් පාසා ම මළ බෙර හඬය. බිය උපදවන භයානක ශබ්දයන්ය. ගෙපිළක් ගෙපිළක් ගානේ පණ අදින දුකට පත් ලෙඩුන්ගේ සීමාවක් නැත.)

බලාපෙරොත්තු නොවූ ලෙස තමන්ගේ රාජධානියට අත්වූ ඛේදනීය ඉරණම පාලක ලිච්ඡවීන් මෙන් ම විශාලා නුවර වැසියන් තුළ ද ඇති කළේ මහත් කම්පනයකි. මේ දරුණු විපතින් ගැලවීමට පිළියම් සෙවීම සඳහා රාජසභාව රැස්විය. එහි දී මැතිඇමතිවරු විවිධ අදහස් සහ යෝජනා ඉදිරිපත් කළහ. ඇතැමෙක් නිගණ්ඨ නාථපුත්ත වැනි ආගමික ශාස්තෘවරුන් ගෙන්වා ඔවුන් ලවා මේ විපත දුරු කරවිය යුතු යැයි කීහ. එයට එරෙහි වූ තවත් කෙනෙක් ගිනි දෙවියා ඇතුළු දෙවිවරුන්ට පුද පූජාවන් කිරීමෙන් මේ වසංගත තත්වය පාලනය කිරීමට හැකිවේයැයි කීහ. බුදුගුණාලංකාර කතුවරයා මේ අදහස් ඉදිරිපත් කිරීමේ දී සෑම අවස්ථාවකම අන්ධ භක්තියෙන් සිදු කරන දේව වන්දනය, නිර්දය ලෙස විවේචනය කරයි. හෙළා දකියි.

**වඳුරෙකු පිනු මුහුද**
**එතෙර ව යා නොහී හිඳ**
**ගියෙල රම් හේ බැඳ**
**මෙසේ වෙද මෙලොව තෙදවියන් තෙද**

රාවණ විසින් පැහැර ගන්නා ලද සීතාව මුදවා ගැනීම සඳහා රාම දෙවියන් දඹදිව සිට ශ්‍රී ලංකාවට පාලමක් බැඳ, තම දිව්‍ය සේනාව සමග පැමිණි බව රාමායණය ඇතුළු ඉතිහාස ග්‍රන්ථයන්හි සඳහන් වෙයි. එහෙත් හනුමන්තා නම් වඳුරු දූතයා, ඔත්තු බැලීමට මෙහි පැමිණියේ ඉන්දියාවේ සිට එක පිම්මකින් ලංකාවට පැනීමෙනි. වඳුරෙකුට පනින්න හැකි වූ මුහුද තරණය කිරීමට දෙවියන්ට පාලමක් බැඳීමට සිදුවිය. දෙවිවරුන්ගේ කෙරුවාවන් එහෙමය. ඔවුන්ට වඳුරෙකුට තරම්වත් ශක්තියක් නොමැත.

වර්තමානයේ කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය නිසා ඛේදජනක ඉරණමකට මුහුණ පා ඇති ලෝකයේ සංවර්ධිත රටවල්වල තත්වය, විශාලා නුවර පෙර සහ පසු ස්වභාවයන් සමග සසඳා බලන්න. භෞතික දියුණුවේ හිණිපෙත්තේ රැඳී සිටියත් සොබාදහම අකාරුණික වී, රෝග නමැති සතුරා අනුකම්පා විරහිත ව පහර දුනහොත් මිල මුදල්, දේශපාලන බලය හෝ තාක්ෂණික දියුණුවෙන් ප්‍රයෝජනයක් නැති බව, එකී රටවල්වල ජනතාව මුහුණ පා ඇති අභාග්‍යසම්පන්න වාතාවරණයෙන් ලෝකයට ප්‍රත්‍යක්ෂ කරවයි. දිව්‍යලෝකයන් මෙන් මනරම් වූ නගර, වෛරසයට ගොදුරු වී විනාශ වී ඇති අයුරු අතිශයින් කණගාටුදායකය. මීට සියවස් 05 කට පමණ පෙර බුදුගුණාලංකාර කතුවරයා දුටු විශාලාව, සජීවී ව දැක ගැනීමට අද අවස්ථාව සැලසීමෙන් පෙනී යන්නේ ලෝකයේ පැවැත්ම සිදුවන්නේ යම්කිසි චක්‍රාකාර රිද්මයකට අනුව බව සිතන්නට අපට ඉඩ ප්‍රස්ථාව විවර කරමිනි.

(මතු සම්බන්ධයි.)



**මැදමුලන කිංචිගුනේ ශ්‍රී චන්ද්‍රබිම්බාරාම විහාරාධිකාරී ශාස්ත්‍රපති ඉඳිපරපේ ධම්මසිරි හිමි**

# ජන දිවියට සත්කාරයක්...






54 වන සේනාංක බලප්‍රදේශයට අයත් කොන්ඩච්චි සිංහල ගම්මානයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් 2020 ජූනි 03 වන දින සිදු කෙරිණ. 54 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒ්අයිජේ බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ මඟපෙන්වීම මත ක්‍රියාත්මක කළ එම සත්කාරයට පුත්තලම ප්‍රදේශයේ මුස්ලිම් ජාතික ප්‍රජාව විසින් ධන පරිත්‍යාග ලබාදෙන ලදී. එම අවස්ථාව සඳහා 54 වන සේනාංකාධිපති, 542 වන බලසේනාධිපති ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක්ද එක්වූහ.

## ඩෙංගු මර්ධනයට රණවිරු දායකත්වය...



57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් බීපීඑස් ද සිල්වා ආර්එස්පී ගේ මඟපෙන්වීම මත 7 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ හට පිරිස්වල දායකත්වයෙන් සංවිධානය කළ ඩෙංගු මර්ධන වැඩසටහනක් 2020 මැයි 22 වන දින කිළිනොච්චි නගරයේදී පැවැත්විණ. කිළිනොච්චි දිස්ත්‍රික්කයෙහි කරච්චි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේද සහය ඇතිව සිදු කළ මෙම වැඩසටහන මඟින් ප්‍රදේශයේ ඩෙංගු රෝගය පැතිරීම වැළැක්වීම අරමුණ විය.

## පූද බිමට සෙවණක්...

59 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්එල්පීඩබ්ලිව් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ගේ අදහසකට අනුව මුලතිව් ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමකට උරුමකම් කියන වට්ටප්පලේ කන්නහි අම්මාන් කෝවිල් පූජා භූමියේ රුක්රෝපණ වැඩසටහනක් ඉකුත් මැයි 25 වන දින ක්‍රියාවට නැංවිණ. එහිදී රුට්බෝල් කළ අඩි 7 කට වඩා උස කොහොඹ ගස් 26 ක් සිටුවීමට පියවර ගන්නා ලදී. 591 වන බසේමු හි සංවිධායකත්වයෙන් සිදුකළ එම වැඩසටහනට 12 ශ්‍රීලපාහ හා 24 ශ්‍රීලංසිරෙ ඒකකයන්හි දායකත්වය හිමිවිය. මෙම අවස්ථාවට 59 වන සේනාංකය හා ඒ යටතේ ඇති සියලුම බලසේනා හා ඒකකයන් හි නිලධාරීන්, සෙසුනිලයින්ද සහභාගී වූහ.



# කොරෝනා මැඩලීමට සහය ලබාදෙමින්...





කොවිඩ් 19 වෛරසය හා ඩෙංගු තර්ජනය හමුවේ ශිෂ්‍ය ප්‍රජාව ආරක්‍ෂා කිරීම වෙනුවෙන් 22 වන සේනාංකය යටතේ සේවයේ නියුතු 100 කට අධික භට පිරිසක් විසින් ඉකුත් ජූනි 19 සිට ජූලි 03 වන දින දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පාසල් ආවරණය වන පරිදි විෂබීජහරණ ක්‍රියාවලියක් හා පිරිසිදු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

ආරක්‍ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපතිගේ මගපෙන්වීම මත 22 වන සේනාංකයේ සේනාංකාධිපති ගේ මෙහෙයවීමෙන් සිදුකළ එම ප්‍රජාසත්කාරයට 221, 222 සහ 223 වන බළසේනාවන්හි භට පිරිස් දායක වූහ. ත්‍රිකුණාමලයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් යුතුව දිස්ත්‍රික්කයේ පාසල් 52 ක් මේ යටතේ පරීක්‍ෂාවට ලක්කර විෂබීජහරණය කිරීම විශේෂත්වයකි.



## නව ජල පිරිපහදු ඒකකයක්...

21 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ නිලධාරීන් හා සෙසුනිලයින් සඳහා දීර්ඝකාලීන අවශ්‍යතාවක්ව පැවති ජල පිරිපහදු ඒකකයක් ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජේඑම්ජේ පෙරේරා ගේ ආරාධනයෙන් 56 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑන් අමරසේකර යූඑස්පී එන්ඩීයූ විසින් 2020 ජුනි 06 දින විවෘත කරන ලදී.



## නව ඉදිකිරීම් සෙසුනිළ අයිතියට...

14 වන ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බලමුළුවේ සෙසුනිලයින්ගේ ප්‍රයෝජනය සඳහා සියලුම නිලධාරීන් හා සෙසුනිලයින්ගේ ශ්‍රමදායකත්වයෙන් තේරාවිල් කඳවුරේ ඉදිකරනු ලැබූ භට නිවාසයක්, නව මුරහලක් සහ වැසිකිලි පද්ධතියක් පසුගියදා සුබ මොහොතින් අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් බීජ්ටීඑස්කේ බස්නායක ආර්එස්පී යූඑස්පී අයිජී විසින් විවෘත කරන ලදී.





## විරු බිමට පින් සෙවණක්...

5 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකා පරිශ්‍රයේ අභිනවයෙන් ඉදිකළ බුදු මැදුරක් පසුගියදා නිරාවරණය කෙරිණ. ඒකක අණදෙන නිලධාරී මේජර් ආර්එම්එස් ජයන්ත රාජනායකගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් සීකේ හඳුන්මුල්ල එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්විය. අණදෙන නිලධාරීගේ උපදෙස් මත ඒකක සාමාජිකයන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිකළ මෙම මනරම් පින්බිම, එම ඒකකයට තිබූ විශාල අඩුවක් සපුරාලීමකි. එම රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ සභාපතිනිය, මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක්ද එම මාහැඟි කටයුත්තට දායකවූහ.

## තුරු මිතුරු නව රටක්...



යුද්ධ හමුදාධිපතිතුමන්ගේ "තුරු මිතුරු නව රටක්" සංකල්පයට අනුව කෘෂිකර්මාන්තය නංවාලීමේ අභිලාශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා මූලස්ථානයේ නවතමයෙන් ආරම්භ කර ඇති කෘෂිකාර්මික ගොවිපල වෙත හා 2(සෙව්) ශ්‍රීලයුපොදුසේබ පිටතවාසී සියළුම නිලයින් වෙත ගෙවතු වගාව ආරම්භ කරමින් ආර්ථික වර්ධනයක් ඇතිකර ගැනීම සඳහා එළවළු, පලතුරු පැල හා එළවළු බීජ වර්ග පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පසුගියදා ක්‍රියාත්මක කෙරිණ. 2(සෙව්) ශ්‍රීලයුපොදුසේබ අණදෙන නිලධාරී ලෙස රාජකාරී කළ ලුතිනන් කර්නල් සීඑස් දේමුණි සිය තනතුරෙහි රාජකාරී භාරදීමට සමගාමීව එම පරිත්‍යාග සිදුකරනු ලැබීය.



## ඩෙංගු මර්ධන වැඩසටහනක්...

ඩෙංගු උවදුර මැඩලීමේ අරමුණින් 11 වන සේනාංක බළප්‍රදේශයට අයත් කටුකැලේ, කිරිබත්කුඹුර, ඔගස්ටවත්ත, රජවැල්ල, නියංගන්දොර සහ දික්ඔය යන ප්‍රදේශයන්හි සංවිධානය කළ ඩෙංගු මර්ධන වැඩසටහනක් 2020 ජූනි 12 වන දින සිදුකරන ලදී. ඊට 111 හා 112 වන බළසේනා මූලස්ථානවල රාජකාරියේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් සහ සෞඛ්‍ය පරීක්ෂකවරු ඇතුළු ප්‍රදේශවාසීන් එක්වූහ.





## සංචාරයක සටහන්...

11 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තු අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් ජේජ්සීඑස් ජාගොඩ පීඑස්සී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන සහ ශ්‍රී ලංකා ඉංජිනේරු බළකා සේනාවිධායක මේජර් ජෙනරාල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පසුගියදා එම ඒකකයේ සංචාරයක නිරත විය.

එහිදී යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන විසින් සියලු නිලධාරීන් හා භට පිරිස් ඇමතූ අතර, අනතුරුව ඒකක පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද නිලධාරී නිවස්නය හා බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය විවෘත කිරීමද සිදුකරන ලදී. එම අවස්ථාවට ශ්‍රී ලංකා ඉංජිනේරු බළකා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු ඇතුළු නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සහභාගි වූහ.

## හරවත් වැඩමුළුවක්...

58 වන සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒපීඅයි ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී යූඑස්පී ගේ සංකල්පයකට අනුව එම සේනාංකය යටතේ පාලනය වන බළසේනා සහ ඒකකයන්හි නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් සඳහා GIS තාක්‍ෂණය මගින් සිතියම් සැකසීම, භූමියේ තොරතුරු ලබාගැනීම, සිතියම් ලකුණු කිරීම සහ තොරතුරු විශ්ලේෂණය කිරීම පිළිබඳ තෙදින වැඩමුළුවක් ඉකුත් ජූනි 19 වන දින 58 වන සේනාංක ප්‍රධාන දේශන ශාලාවේදී පවත්වන ලදී.

මෙම වැඩමුළුවෙහි දේශන සහය සඳහා සංඥා බළකායේ විශ්‍රාමික ලුතිනන් කර්නල් ලලින්ද කහඳගමගේ ආර්එස්පී, ගැමුණු හේවා බළකායේ මේජර් වසන්ත විජේකෝන් සහ සෙලාටාටෙක් සිස්ටම් සොෆ්ට්වෙයාර් ඩිවලොපින් සමාග මේ වෙළඳ කළමණාකරු චාමක මධුරංග යන මහත්වරු දායකත්වය ලබාදුන්හ.



## "ADMIN IN THE FIELD" ග්‍රන්ථය එළිදක්වමින්....

ගැමුණු හේවා රෙජිමේන්තුවට අයත් නිලධාරියෙකු වූ බ්‍රිගේඩියර් කේඑච්කේ කෝට්ටවත්ත ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් රචිත "ADMIN IN THE FIELD" නමැති ග්‍රන්ථය 2020 ජුනි 12 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී එළිදැක්විණ. යුද්ධ හමුදා නිලධාරීන්ගේ හමුදාමය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ලියා ඇති එම ග්‍රන්ථය එළිදැක්වීමේ අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක සහ ගැමුණු හේවා බළකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ වෙත එහි කතුවරයා මංගල පිටපත පිළිගැන්වූ අවස්ථාව මෙහි දැක්වේ.





## නව කාර්යාලය සෙසුනිළ අයිතියට...

සියලු නිලයින්ගේ ශ්‍රම දායකත්වයෙන් 68 වන සේනාංක මූලස්ථානයේ ඉදිකළ නව කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉකුත් ජූනි 20 වන දින සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්පීජේ රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයකදී සුබ මොහොතින් විවෘත විය.

## අභිමානවත් නික්මයෑමක මතක සටහන්...





ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආරක්ෂක සේනා සැරයන් මේජර් ලෙස රාජකාරී කළ 10 වන ශ්‍රී ලංකා ඉංජිනේරු බළකායට අයත් සෙ/239105 බනි 1 වයිඑම්එන්ජී යාපා වසර 22 ක සේවා කාලයකින් පසු ඉකුත් ජූනි 27 දින යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාම ලැබීය. ඒ නිමිත්තෙන් ඔහුගේ සේවය අගයා ආරක්ෂක සේනා මූලස්ථානයේදී සම්මාන පෙළපාලියකින් පිදුම් ලැබූ ඔහු වෙත බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් ආර්ජ්ඩීපී රණවක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් සමරු තිළිණයක්ද පිළිගන්වන ලදී.

## "යුද සාහිත්‍යය" දේශනයන්...





යුද්ධ හමුදා අංශ, ආයතන තුළ හා සිවිල් සමාජය අතර "යුද සාහිත්‍යය" ප්‍රචලිත කිරීම වෙනුවෙන් යුද හමුදා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවීමෙන් දීපව්‍යාප්තව සිදුකෙරන දේශන මාලාවේ තවත් අධියරක් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බළකායේදී ඉකුත් ජුනි 24 වන දින පැවැත්විණ.

එම රෙජිමේන්තුව යටතේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරියෙහි නියුතු මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ විසින් මෙහෙයවන ලදී. තිස්වසක් පුරා මෙරට පැවති ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ ඓතිහාසික සටනට පණදුන් අභීත විරුවන්ගේ මතක හා අත්දැකීම් පිළිබඳ අලුත් පරපුර දැනුවත් කිරීමත්, එකී මෙහෙවරට සෘජු ලෙස දායක වූ විරුවන් අගයමින් යුද සාහිත්‍යයක් මෙරට තුළ බිහිකිරීමත් මෙම වැඩසටහනෙහි අරමුණයි.



# MORAL COURAGE

There is no argument that to become a leader is a blessing and a privilege. However, the privilege of being a leader will be a waste or bane if the leader does not possess the required leadership traits and character of a true leader. Out of many leadership qualities, moral courage can be considered as a key or predominant. With my over three decades long experience in the Army, I have seen how subordinates who are under leaders with less moral courage suffer and become unproductive.

Moral courage is the courage to take actions or decisions for moral reasons despite the risk of adverse consequences. In simple terms, moral courage is nothing but distinguishing right from wrong. It is about taking decisions what you think right and when and where necessary, regardless of the outcome that would befall on you. If a leader lacks this quality, the organization does not move forward and cannot achieve the desired goals. Further, higher authorities and subordinates would lose their confident on such leaders.

Why and how do certain junior and middle level leaders lack moral courage? There may be a variety of reasons for this sad state. A prime reason is lack of knowledge. When someone does not know his/her job or lacks knowledge related to his or her job, he/she obviously fails or becomes slow in taking actions or decisions. The other reasons are, fear of taking risks due to various reasons such as next rank syndrome, selfishness, hypocrisy and lack of confidence. To overcome this weakness and Developing the trait of moral courage is not that difficult, if you have a strong desire to improve it. The first thing is, you should have an enthusiasm to improve your knowledge. It does not mean that you should be a maestro in a particular field, but you should possess an above average updated knowledge about your job. It will definitely improve your confidence as well as that of your subordinates.

I have seen many leaders who are reluctant to take certain decisions due to the fear of their future (next rank syndrome). The subordinates under such leaders are always under a dilemma as they cannot execute things without clear directions or guidance from their leaders. However, the reality is we must all take risks if we want to make progress in our jobs and in our lives. By careful analysis, we can minimize the chances of failure, but we can never eliminate it. By always playing safe, we may avoid risks, but you will never feel the great joy and satisfaction that results from overcoming the obstacles and reaching your goals.

Being positive is another way to improve your moral courage. There is no any uplifting habit better than that of bearing a hopeful attitude, believing that things are going to turn out well and not ill, and we are going to succeed and not fail. Carrying your own optimistic and expectant attitude is good but never allow yourself to get into a pessimistic, discouraging mood which ultimately leads to poor moral courage.

We have seen some qualified, talented and knowledgeable officers who are slow in their action and not ready to help others. It may be due to their hollowness, jealousy or even egoism. These bad qualities invariably lead to dispirited moral courage.

It has to be accepted that all of us have failed in some thing or the other in our lives, but we got to learn from our mistakes and try to overcome them in the future. We are often afraid of trying new ideas, actions or unusual approaches to solve problems or taking action at the right time because we lack the much-needed leadership quality, moral courage - the trait that is compulsory to be an astute leader.

Brig Keerthi Kottawaththa

Comd 613 Bde

## සෙබළ පෙම්වතී....

අඩුගානෙ මාසෙකට
වතාවක් දකින්නැති
හිටි අඩියෙ දෙමාසෙත්
නොදැනීම ඉක්ම යන
ඒත් උඹ ගැන හිතන
සෙබළ පෙම්වතී මං...

බස් එකේ පෙම්මුල්ලෙ
තුරුළු වී කිටි කිටියෙ
වැහි දාට එක කුඩේ
යට ඉඳන් තෙමෙන නෙක
ජෝඩු දැක සුසුම්ලන
සෙබළ පෙම්වතී මං...

හිරට අත් දෙක නමන
ඉනට කලිසම අඳින
කොන්ඩෙ ඩයි පොදක් නැති
ඒ හින්ද මං කැමති
නුඹ ආදරේ කරන
සෙබළ පෙම්වතී මං...

ගෝනියක් බඩු අරන්
නිවාඩුවෙ ගමට එන
වට කරන් ගෙදර අය
යුද්දෙ ගැන කියාදෙන
බය දැනෙන දුක හිතෙන
සෙබළ පෙම්වතී මං...

ෂෙඩ් එකේ තෙල් බටෙං
දඬු මොණරෙ පුරෝගෙන
ගම වටේ දුම් දමන්
අකුණු වේගෙන් ඇදෙන
නලාවට අත වනන
සෙබළ පෙම්වතී මං...

මේජර් සුජිත් චමින්ද
එදිරිසිංහ...



## ඒකක සංචාරයක නිරතවෙමින්...



ආරක්ෂක සේනා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩීඒපීඑන් දෙමටන්පිටිය එන්ඩීයූ පීඑස්සී ශ්‍රී ලංකා සංඥා බළකායේ 12 වන බළකාධිපති ලෙස රාජකාරී ආරම්භ කිරීමෙන් අනතුරුව පසුගියදා 1, 3, 4, 6, 9 සහ 2(සෙව්) ශ්‍රී ලංකා සංඥා බළකා ඒකකයන්හි සංචාරයක නිරත විය. එහිදී එම ඒකකවල රාජකාරී අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ හෙතෙම, සියලු නිලයින්ගේ සුබසාධන කටයුතු නංවාලීමටත්, ඒකකයන්හි අභිවෘද්ධිය වෙනුවෙන් ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳවත් අවදානය යොමු කරන ලදී.

## 681 බළසේනාවේ ඓතිහාසික ඇරඹුම...



68 වන සේනාංකය යටතේ මුලතිව් උදයාර්කට්ටු ප්‍රදේශයේ ස්ථාපිතව පැවති 683 වන බළසේනාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා බළසේනා ප්‍රතිස්ථාපනය කිරීම යටතේ 681 වන බළසේනාව ලෙස නම් කරන ලදී. ඒ අනුව නව බළසේනාවේ චාරිත්‍රානුකූල වැඩ ආරම්භ කිරීම 2020 මැයි 25 වන දින බළසේනාධිපති කර්නල් ඩීආර්එන් හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් සිදුකරන ලදී

## ලේ දන්දීමේ වැඩසටහනක්...





යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය මත 54 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඒඅයිජේ බංඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ගේ පූර්ණ අධීක්‍ෂණය හා මඟපෙන්වීම යටතේ සංවිධානය කෙරුණු ලේ දන්දීමේ වැඩසටහන් දෙකක් ඉකුත් ජූනි 14 වන දින 54 වන සේනාංක මූලස්ථානයේදී සහ 7 වන විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. අනුරාධපුර ශික්‍ෂණ රෝහල සහ මන්නාරම මහ රෝහලේ දැනට පවත්නා රුධිර හිඟතාවය මත කරන ලද ඉල්ලීමකට අනුව මෙම මාහැඟි කටයුත්තට යුද්ධ හමුදාව එක්විය.



## සංචාරයක මතක සටහන්...

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකායේ බළකාධිපති මේජර් ජෙනරාල් එල්පීආර් ප්‍රේමලාල් යූඑස්පී සිය ධූරයේ රාජකාරී ආරම්භ කිරීමෙන් අනතුරුව ඉකුත් ජූනි 27 වන දින යාපනය, කන්කසන්තුරය ප්‍රදේශයේ ස්ථාපිත 4 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බළකායෙහි සංචාරයක නිරත විය. එහිදී එම ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් කේජ්කේඑස් ප්‍රසන්න ගේ ගෞරවනීය පිළිගැනීම මධ්‍යයේ සිදුවූ බළකාධිපති ගේ එම සංචාරයට සියලු නිලයින් ඇමතීම, සියලු නිල තේ පැන් සංග්‍රහය, කඳවුරු පරික්‍ෂාව සහ යුද්ධ හමුදා චරිත ශෝධනාගාරය පරික්‍ෂා කිරීම ඇතුළු සුවිශේෂී කටයුතු රැසක් සිදුවිය.

## ධනාත්මක සිතුවිලි වර්ධනයට...





"ධනාත්මක සිතුවිලි තුළින් ව්‍යසනයෙන් ආරක්‍ෂා වෙමු" මැයෙන් වූ දේශනයක් ඉකුත් ජූනි 03 වන දින කහගොල්ල අතරමැදි කඳවුරේදී පැවැත්විණ. යුද්ධ හමුදාධිපතිතුමන්ගේ මගපෙන්වීම යටතේ මධ්‍යම ආරක්‍ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීසීකේ කොස්තා ආර්එස්පී යූඑස්පී ගේ උපදෙස් මත සංවිධානය කෙරුණු එම දේශනය මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්‍ෂක මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් යුතුව එහි සේවයේ නියුතු ලුතිනන් කර්නල් සමන්ති බණ්ඩාර විසින් මෙහෙයවන ලදී.

වෘත්තීය දිවියේ නේකවිද කඩඉම් පසුකොට
සුබ මොහොතින් නව තනතුරු ලැබූ
ඔබ සියලූ දෙනාට දිරිය, විරිය, රැකවරණය ලැබේවායි "රණවිරුවා" ද
මෙසේ සුබ පැතුම් එක්කරයි.



යුද්ධ හමුදා ආධුනිකයින්
බඳවාගැනීමේ අධ්‍යක්‍ෂ
මණ්ඩලයේ අධ්‍යක්‍ෂ ලෙස
බ්‍රිගේඩියර්
එම්කේඑස් සිල්වා ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී



ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ
බළකායේ කර්නල් සේනාවිධායක
ලෙස
මේජර් ජෙනරාල් ඒඑල්පීඑස්
තිලකරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී පීඑස්සී

2020 ජුනි මස 01 දින සිට



ආඥා මූලස්ථානය යුද්ධ හමුදා
පුහුණු ප්‍රමාණි 1 (පුහුණු සංකල්ප හා
අධීක්‍ෂණ) ලෙස
ලුතිනන් කර්නල් ඒඑච්එම්ටී
ගුණරත්න ආර්එස්පී පීඑස්සී

2020 ජුනි මස 04 දින සිට



ආරක්‍ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර) ආඥාපති ලෙස
මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑච්ඒඑස්
බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී
එන්ඩීයූ

2020 ජුනි මස 01 දින සිට



643 වන බලසේනාවේ
බලසේනාධිපති ලෙස
කර්නල්
කේටීපී ද සිල්වා ආර්එස්පී පීඑස්සී

2020 ජුනි මස 29 දින සිට



2 වන යුධෝපකරණ බළකායේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
ඊඑම්ටීපීජීඩබ්ලිව් ඒකනායක
ඒටීබී

2020 ජුනි මස 02 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නියෝජ්‍ය
මාණ්ඩලික ප්‍රධාන ලෙස
මේජර් ජෙනරාල් එච්ආර්එන්
ප්‍රනාන්දු ආර්එස්පී එන්ඩීසී

2020 ජුනි මස 01 දින සිට



ඉදිරි නඩත්තු පෙදෙස
(නැගෙනහිර) ආඥාපති ලෙස
බ්‍රිගේඩියර්
ඩබ්ලිව්ඒ ආරියරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී

2020 ජුනි මස 15 දින සිට



10 වන කාරක ඉංජිනේරු
රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී
ලෙස
මේජර්
ඩබ්ලිව්කේඑස්ටී කන්නන්ගර
පීඑස්සී
2020 ජුනි මස 09 දින සිට



14(සේවා) ශ්‍රී ලංකා පාබල
හමුදාවේ අණදෙන නිලධාරී ලෙස
මේජර්
ජේඑන්පී ලියනගම

2020 ජුනි මස 04 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ
මාණ්ඩලික ප්‍රධාන ලෙස
මේජර් ජෙනරාල් එච්ජේඑස්
ගුණවර්ධන ආර්එස්පී වීඑස්වී
යූඑස්පී එන්ඩීසී පීඑස්සී
2020 ජූනි මස 01 දින සිට



57 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
බ්‍රිගේඩියර්
ඩීජීඑස් සෙනරත්යාපා
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු
2020 ජූනි මස 01 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය
(යාපනය) මානි 1 (පාලන) ලෙස
ලුතිනන් කර්නල්
ඒඑම්ඒ දේශප්‍රිය
2020 ජූනි මස 12 දින සිට



1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා
පොදුසේවා බළකායේ අණදෙන
නිලධාරී ලෙස
ලුතිනන් කර්නල් සීඑස් දේමුණි
2020 ජූනි මස 01 දින සිට



ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා
බළසේනාවේ සේනාවිධායක ලෙස
මේජර් ජෙනරාල්
ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියු
2020 ජූනි මස 01 දින සිට



ආරක්ෂක සේනා මූලස්ථානය (කිළි)
බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික ලෙස
බ්‍රිගේඩියර්
ඩීඑම්ඒපී දිසානායක ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී යූඑස්පී එන්ඩියු අයිජී
2020 ජූනි මස 03 දින සිට



1 වන ගැමුණු හේවා බළඇණියේ
අණදෙන නිලධාරී ලෙස
මේජර්
වයිආර්අයි දිසානායක
ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එල්එස්සී
2020 මැයි මස 20 දින සිට



යුද්ධ හමුදා මූලස්ථානයේ
අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන
මාණ්ඩලික ලෙස
මේජර් ජෙනරාල් බීපීඑස් ද
සිල්වා ආර්එස්පී
2020 ජූනි මස 01 දින සිට




64 වන සේනාංකයේ ප්‍රමානි 1
(ක්‍රියා) ලෙස
ලුතිනන් කර්නල් පීඒආර්
විජේරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී
2020 ජූනි මස 02 දින සිට



11 වන සේනාංකයේ
සේනාංකාධිපති ලෙස
මේජර් ජෙනරාල්
ඩබ්ලිව්එම්ජේආර්කේ
සේනාරත්න ආර්ඩබ්ලිව්පී
ආර්එස්පී
2020 ජූනි මස 01 දින සිට

මිහිනි
ලිමන්සා





නුහස්මි
පැහැසරා



හංස
සස්මින



තීක්ෂණා
තිලක්ෂි




මනුලි
ලිමන්සා



නිතිෂ්
සංහිත



හිරුදි
දිව්‍යාංජලී



සෙනුදි
දෙහන්සා

# හිරු තරු සේ දිලෙන විරු දරු සැමරුම්

මල් කැකුළු වන් රණවිරු දුවා දරුවන්ට සුව සැපත, ජය සතුට පිරි වාසනාවන්ත උපන් දිනයකට "රණවිරුවා" මෙලෙස සුබ පැතුම් එක්කරයි.

# සිතුවිලි සාගරය

## දා හත් වසරක සැමරුම්...

පොසොන් මහේ එක සොඳුරුම දිනකදි
නුඹ මගෙ පතිනිය වූදා...
දා හත් වසරක් ගතවී ඇතිමුත්
නුඹ නැත වෙනසක් වීලා...
කොතෙකුත් කරදර බාධා ආවත්
නැත මා... හා විරසක වීලා...
මවක... යහලුවෙකු... සොයුරිය වාගේ
සැමදා මා ලග හිටියා...

නැත බිඳුවක් වත් වරදක් මාගෙන්
නුඹ හට වෙන්නේ කිසිදා...
සැක සංකාවෙන් එපා සිතන්නට
ඉමු අපි සතුටින් සැමදා...
මමයි නුඹේ හිරු... නුඹයි මගේ සඳු
එදා මෙදා මෙන් මතුදා...
"මහේෂිකාවකි" නමට අරුත දුන්
දිවියේ පන නුඹ වූදා...

මා/සැරයන් අත්තනායක ඒඑම්සී
14 ශ්‍රීලංජාආබමු

## සොයුරාණෙනි...

සදාදර සොයුරාණෙනී...
රූපයටම රත්නයක් වූ
ඔබ ගුණ සමුදාය
නිමක් නැති සයුර පරදවයි
අනුපමේය මෙහෙවරක් කළ
ඔබ අපෙන් සමුගත්තේ
ඇයි ද කියා හරිම ශෝචනීයයි
එදා අතීතයේ යුද වැදුණ
වීර සෙබළෙකු මෙන් ඔබද
උරදුන් ඔබ අපි දන්නෙමු
ඔබ අපට සදා අමරණීයයි...
ඉතින්... ඔබ වන්
සොහොයුරෙකු අපට
අහිමි වූ දුක කියා
නිමකළ නොහැක
මතු උපදින හැම භවයකම
අපට හමුවේවා
කිසි දිනෙක අකල් මරණයකට
ගොදුරු නොවේවා...

එල් ජයසුන්දර මැණිකේ
ප්‍රාදේශීය සිවිල් පරිපාලන නිලධාරී
කාර්යාලය - මින්නේරිය

## නිරෝධායනය...

දරුවන් නැත නෙත ගැටෙනා මානයක
බිරිඳත් ගෙපැලේ ඇත සිතිවිලි අතර
නැත නිදහසක් සැම අත සැරි සරන්නට
බැමි බැඳ සිරකරත් නිදහස් නැත මහද

නෙතු අග නිරතුරුව රැඳුනා මිහිරි දසුන්
දෙසවන සොයන හඬ ලබැඳිය සුමියුරුය
අත රැඳි දුරකථනෙ ගෙන නිරතුරු සොයන
දුර සිට රකිමි ලබැඳිය නිවසේ සොඳුරු

සිරගත කරන් ඇත දින 14 ක් එකට
රාජකාරි නැත වටකර මිතුරු කැළ
ගෙවනව පව් භවයක පෙර කළ පවට
වසංගතය රුදුරුය ලොව මවිත කළ

පෙර මං බලයි දරුවන් යළි ගෙදර යන
සුරතල් කරනු බැරි පෙරමෙන් සිප වැළඳ
බිරිඳත් දරුවො මීටරයක දුරින් හිඳ
නිරෝදායනය යළි වෙන්නට වෙයිද

ඇහෙනව පෙනෙනවා දැනෙනව නිරන්තර
මිනිසුන් විඳින දුක මේ කඳවුරක් තුළ
දුරකථනෙකින් පීතු පාදං නමාමි
දරුවන් වඳී පියවරුනට පෙර නින්ද

යන්නට වසංගත පහවී ලොව රුදුරු
හැකි වේවා පෙර ලෙස දිවි ගෙවන්නට
තුන් බිය දුරු කළා සේ බුදුහිමි පෙරදී
පතනෙමු පහල වන්නට බුදුවරු යළිදු

අජන්ත හේරත්
අයවැය හා මුදල් පරිපාලන
අධ්‍යක්ෂ මණ්ඩලය

## තත්පරයත් වටින ජීවිතය...

ජීවිතය ගෙවී යන්නේ වයසත් එක්කම
ළමාවිය යෞවනය මහළු වියත් එක්කම
ඉතින් අපි මිය යයි දිනක
අතීතය හැමදේම අතහැර...
තත්පරයත් වටින බව වැටහෙයි දවසක නුඹට
අවබෝධ කරන් ජීවිතය කුමක්ද යන්න...
විඳවන ජීවිතයට තිත තබා
විඳින්න මුළු ජීවිතයම
අවසන් හුස්ම තෙක්...

සෙ/කියු104364 ලා/කෝ බංඩාර කේඑම්ජීඑච්
9 ශ්‍රීලංජාආබමු
යුද හමුදා කඳවුර
සුගන්ධිපුරම්
පුදුකුඩිඉරිප්පු

## ජීවිතය...

සියළු දෙය හමුවන
සියළු දෙය හිමිවන
කල්පයකි ජීවිතය...
සියළු දෙය වෙන්වන
සියළු දෙය අහිමි වන
මොහොතක්ය මරණය...
සුදු සහ කළු ලෙසින් පෙණුනත්
සිත පරදන ඡායා පමණයි...
ජීවිතය...

සෙ/ආර්00478
කෝප්‍රල් ජයසේන ආර්ජීඑන්එන්
රෙම ශ්‍රීලයූකාබ

## රණවිරුවා...

පෙර අත් භවේ සිට
ඔබ පින් කෙරුවා
පින්වත් මව්පියන්
ඔබ බිහි කෙරුවා...

කාලය නොකා කාලය
ඔබ වැය කෙරුවා
අත පය සමග බුද්ධිය
ඔබ සරි කෙරුවා...

දහවල රැයද එකසේ
ඔබ වැය කෙරුවා
ඩහදිය රුහිරු කැට
ඔබ බිම හෙලුවා

දින සති මාස අවුරුදු
ඔබ නිදි මැරුවා
කියූ දේ කියූ සැටියෙන්
ඔබ ඉටු කෙරුවා...

තම දිවි පරදු කොට
ඔබ වැඩ කෙරුවා
භීතිය, සැකය, සොම්නස
ඔබ නැති කෙරුවා...

රට දැය රැකුමට
ඔබ දිවි පිදුවා
පින්වත් පුතණුවනී
ඔබ රණවිරුවා

මේජර් (වෛද්‍ය)
ඩබ්ලිව්ජීඑල් ජයරත්න

# සුහද හමුවක මතක සටහන්...



දිවයින පුරා විසිර සිටින ගැමුණු හේවා බළකායට අයත් සියලු ජ්‍යෝෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් එකමුතු කළ රාත්‍රී භෝජන සංග්‍රහයක් ඉකුත් ජූනි 26 වන දින ගැමුණු හේවා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. යුද්ධ හමුදා සම්ප්‍රදායන් ඉදිරියට පවත්වා ගැනීමටත් ගැමුණු හේවා බළකායේ සාමාජිකයින් අතර සුහදත්වය සහ සහජීවනය වර්ධනය කිරීමත් එහි අරමුණ විය. එම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මෙන්ම ගැමුණු හේවා බළකායේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් ටීඑස් බන්සජායා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස එක්විය.

---


## රණවිරුවා

**පරිගණක අකුරු සංයෝජනය, කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 මා/සැරයන් සේනාරත්න
ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ
එම්ජීඒඑම් - 11 ඉසේරෙ
සෙ/754676 ලාන්ස් කෝප්‍රල්
ලක්තිළිණ ඩබ්ලිව්ආර් - 11 ඉසේරෙ

**රණවිරුවා ලිපිනය**

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.

**ඊමේල්**

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445/51446

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම්
අධ්‍යක්ෂ මණ්ඩලය







**අධීක්ෂණය**

බ්‍රිගේඩියර් එම්පී කරුණාරත්න අයිජී



**උපදේශකත්වය**

ලුතිතන් කර්නල් ඩීඑම්එම් දිසානායක
ආර්ඩබ්ලිව්පී



**ප්‍රධාන සංස්කාරක**

මේජර් සුජිත් චමින්ද එදිරිසිංහ
ශ්‍රීලයුපොදුසේබ



**සහාය සංස්කාරක**

කපිතන් ආර්ඩී හේවාවිතාරණ - ශ්‍රීලයුකාබ



# කොවිඩ් - 19 පාලනය කිරීම සඳහා යුද්ධ හමුදාවෙන් නවෝත්පාදන රැසක්...

කොවිඩ් - 19 වෛරසය පාලනය කිරීම සඳහා නවීන තාක්ෂණයට අනුව නව්‍යකරණය කරන ලද මානව කේන්ද්‍රීය වෛද්‍ය විද්‍යාත්මක නවෝත්පාදන උපකරණ 29 ක් ඉතා කෙටි කාලයක් තුළ එකම ස්ථානයක් තුළින් නිෂ්පාදනය කර ඉකුත් ජූනි 10 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ප්‍රදර්ශනය කරන ලදී. මෙම අවස්ථාවට ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන මෙන්ම යුද්ධ හමුදාධිපති හා කොවිඩ් - 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයේ ප්‍රධානී ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ආරාධනයෙන් ආරක්ෂක ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමාද සහභාගි විය.





රණවිරුවා

2020 ජූනි • 218 කලාපය

# දිශාව, දුර හා කෝණය



රණබිමේ මතක

හරියට ඉලක්කයක් ගන්න කොට නිවැරදි දිශාව, කෝණය වගේම දුර ගැනත් හිතන්න වෙනව. යුද්ධයක ජයග්‍රහණය රඳා පවතින්නේ භට පිරිස්වල චිත්ත ධෛර්යය, අවි ආයුධවල ප්‍රතිඵලදායී බව වගේම අරමුණ, අධිෂ්ඨානය හා කැපවීම වගේ කරුණු මතයි. තිස් අවුරුද්දක් තිස්සේ අපේ රටේ තිබුණු ත්‍රස්තවාදය නිමකළ සටනේදී මේ හැම කාරණයක්ම හරියටම සමපාත කරන්න අපට හැකිවුණා. අද මුළු රටම අත්විඳින්නෙ ඒ සාර්ථකත්වයේ ප්‍රතිලාභයි. ඒත් අපි අමතක කරන්න හොඳ නැහැ. වෙඩි වදින තැන විතරක් නෙවෙයි වෙඩි තබන තැනත් අවධානමක් තිබුණු බව....



මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ.